# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

## ප්‍රසිද්ධ දැන්වීමයි

වරින්වර සංශෝධිත 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වන වගන්තිය ප්‍රකාරව මෙම කොමිෂන් සභාව වෙත ව්‍යවස්ථාපිත ප්‍රකාශන ඉදිරිපත් කර එහෙත් මේ දක්වා එකී,

❖ පනතේ 19 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා පනත බලාත්මක වන දින සිට වර්තමානය දක්වා ඉඩම් වෙන්කර මැණුම් කර ගැසට් පත්‍රයේ පලකර නොමැති තැනැත්තන් හෝ ඔවුන්ගේ උරුමකරුවන්

❖ පනතේ 14 වන වගන්තිය යටතේ පවුල තුල පැවරීම වශයෙන් ඉඩම් ලබා ගැනීමට අනුමැතිය ලැබී ඇති එහෙත් අනුමත බිම් ප්‍රමාණය ලැබී නොමැති පනත බලාත්මක වන දින වන විට සිටි ප්‍රකාශකගේ වයස අවුරුදු 18 ක් හෝ ඊට වැඩි දරුවන් හෝ ප්‍රකාශකගේ දෙමවුපියන් හෝ ඔවුන්ගේ උරුමකරුවන්

❖ පනතේ 22(1) ඊ වගන්තිය යටතේ ඉඩම් ලබා ගැනීමට අනුමැතිය ලැබී ඇති එහෙත් මේ වන තෙක් අනුමත බිම් ප්‍රමාණය නොලද කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ උපරිමය පැන වූ අවස්ථාවේදී වයස අවුරුදු 18 ට අඩුව සිටියා වූ ද, ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය බලාත්මක වන විට ඉඩම් අයිතිව සිටි තැනැත්තන් හෝ උරුමකරුවන්

❖ උපරිම සීමාවට අඩු කෘෂිකාර්මික බිම් ප්‍රමාණයක් හිමිව සිටියාවූද තම පුද්ගලික ඉඩම කොමිෂන් සභාව වෙත පැවරී ඇත්තා වූ ද එකී පැවරීම හේතුකොටගෙන විකල්ප ඉඩමක් ලබා ගැනීමට පනතේ 22(1) “අ” වගන්තිය යටතේ හිමිකම එවකට ලැබී ඇත්තා වූ ද තැනැත්තන් හෝ ඔවුන්ගේ උරුමකරුවන්

තම හිමිකම හෝ උරුමය තහවුරු කෙරෙන ලේඛන සමඟ ප්‍රධාන කාර්යාලය වෙතින් හෝ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල අධ්‍යක්ෂ වෙතින් හෝ www.lrc.gov.lk වෙබ් අඩවිය තුලින් බාගත කරගන්නා ලද විස්තර පත්‍රිකාව සම්පූර්ණ කර පහත ලිපිනයේ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ ඒ සඳහා ස්ථාපිත කර ඇති විශේෂ ලිපි බහලුමට දැමීමට හෝ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ lrc.legal.obligations@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කිරීම හෝ යන ක්‍රම වලින් එකකට පමණක් යොමු කර ඒ සඳහා විශේෂිත වූ අංකයක් වර්ෂ 2023 මැයි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ලබා ගන්නා ලෙස දන්වා සිටිමි. තවද ඉහත දිනෙන් පසුව නීතිමය බැඳීම් වශයෙන් ඉඩම් ලබා ගැනීමට ඉදිරිපත් කරන ඉල්ලීම් සලකා බලනු නොලබන බව වැඩිදුරටත් දන්වමි.

නීතිඥ නිලන්ත විජේසිංහ
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

අංක 475,
කඩුවෙල පාර,
බත්තරමුල්ල.
2023.04.25